# උත්තර භාරතයෙහි සහ විදේශයන්හි හෝලී උත්සවය සැමරීම අතර පවතින සම විෂමතා

***අතපත්තු, ඒ. එම්. එස්. ජේ. බී.*** [1]

හෝලී උත්සවය භාරතීය සංස්කෘතියේ දක්නට ලැබෙන එක් ප්‍රධාන උත්සවයකි. මෙහි ඇති සුවිශේෂ ලක්ෂණයක් වන්නේ ආගම්, ජාති, කුල ආදි භේද කිසිවක් නොතකා සියලු භාරතවාසීන් එකට එක්වී කටයුතු කිරීමයි. එකිනෙකා අතර අන්‍යෝන්‍ය සහයෝගය වර්ධනය කර ගැනීම හෝලී සැමරුමේ ප්‍රධාන අරමුණක් වශයෙන් දැක්විය හැකිය. නිදසුනක් ලෙස ඉන්දියාවෙහි නොයෙකුත් හේතු පදනම් කරගෙන බෙදී සිටින ජනතාවට එකට එක්ව සහයෝගය වර්ධනය කර ගැනීමට මෙය කදිම අවස්ථාවකි. තවද හෝලී සැමරුම ආගමික සැමරුමක් මෙන්ම විනෝදාස්වාදය සඳහා වූ සැමරුමක් ලෙසද අර්ථකථනය කළ හැක. අතීතයේදී භාරතයේ පමණක් සමරන ලද උත්සවයක් වූ හෝලී, වර්තමානය වන විට නේපාලය, පාකිස්තානය, බංගලාදේශය, ශ්‍රී ලංකාව වැනි ආසියාතික රටවල් මෙන්ම ඇමරිකාව, එක්සත් රාජධානිය, අප්‍රිකාව, ෆීජි, මුරුසිය වැනි ආසියාවෙන් පිටත රටවල් වෙතද ව්‍යාප්තව ඇත. මෙසේ ඉන්දියානු සංස්කෘතිය ඉන්දියාවෙන් ඔබ්බට ව්‍යාප්ත වීමේ එක් මාධ්‍යයක් ලෙසද හෝලී උත්සවය සඳහන් කළ හැකිය. තවද ඉහත සඳහන් කළ ඇතැම් රටවල් විසින් හෝලී උත්සවය සමරනු ලබන කාල සීමාව, හෝලී සැමරීමේ පරමාර්ථ, එය සැමරීමේදී අනුගමනය කරන්නා වූ චාරිත්‍ර සහ හෝලී සැමරීම සඳහා උපයෝගී කරගන්නා වූ ද්‍රව්‍ය ආදිය ඉන්දියාවේ සාම්ප්‍රදායික හෝලී උත්සවයට සාපේක්ෂව විවිධත්වයක් උසුලයි. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ඉන්දියාවේ සහ විදේශයන්හි හෝලී සැමරීම අතර ඇති සම-විෂමතාවන් පිළිබඳ අධ්‍යයනයයි. මෙම අධ්‍යයනය, ශ්‍රී ලංකාවේ හෝලී සැමරුමේ පුද්ගලික අත්දැකීම්, ඉන්දියාවේ සහ අනෙකුත් රටවල හෝලී සැමරුම් පිළිබඳව අන්තර්ජාලයෙන් ලබාගත් කරුණු මත පදනම් වී ඇත.

**ප්‍රමුඛ පදඃ** භාරතීය සංස්කෘතිය, හෝලී උත්සවය

[1] *ශාස්ත්‍රවේදී (විශේෂ) ප්‍රථම වසර, හින්දී අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*samindawrc@icloud.com*